# ප්‍රවෘත්ති නිවේදනය
# Press Release


**පරිසර, වනජීවී, වන සම්පත්, ජල සම්පාදන,**
**වැවිලි හා ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශය**
"සොබාදම්පියස", අංක 416/සී/1, රොබට් ගුණවර්ධන මාවත, බත්තරමුල්ල. දුරකථන ඃ 0112034100(4349)


**2024.10.24**

අධ්‍යක්ෂ ප්‍රවෘත්ති / ප්‍රවෘත්ති කතෘ

## කඳුකර දමිළ ජන ප්‍රජාව වෙනුවෙන් වූ සංවර්ධන ව්‍යාපෘතීන් කඩිනම් කිරීමට පියවර

මෙරට ජාතික ආර්ථිකයට ප්‍රමුඛ දායකත්වයක් ලබා දෙනු ලබන කඳුකර දමිළ ප්‍රජාවගේ සමාජ ආර්ථික මෙන්ම සංස්කෘතික ජීවිතය වඩාත් යහපත් කර ගැනීමේ අරමුණින් රජය විසින් ක්‍රියාත්මක කර තිබෙන සංවර්ධන ව්‍යාපෘතීන් කඩිනමින් අවසන්කර එහි ප්‍රතිලාභ ජනතාවට හැකි ඉක්මනින් ලබා දෙන ලෙස පරිසර, වනජීවී, වන සම්පත්, ජල සම්පාදන, වැවිලි හා ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍ය විජිත හේරත් මහතා විසින් ඊයේ (2024.10.23) දින පස්වරුවේ අදාල ආයතනයන් හි නිලධාරීට උපදෙස් ලබා දුන්නෙය.මෙම අවස්ථාවට අමාත්‍යාංශ ලේකම් බී.කේ ප්‍රභාත් චන්ද්‍රකීර්ති මහතාද සහභාගී විය.

පරිසර, වනජීවී, වන සම්පත්, ජල සම්පාදන, වැවිලි හා ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශය යටතේ පවතින "වැවිලි කලාප සඳහා වූ නව ගම්මාන අධිකාරිය, වැවිලි මානව සංවර්ධන භාරය සහ සෞම්‍යමූර්ති තොන්ඩමන් භාරය" යන රාජ්‍ය ආයතනයන් යටතේ ක්‍රියාත්මක සංවර්ධන ව්‍යාපෘති කිහිපයක් සම්බන්ධව මෙම රැස්වීමේ විශේෂ අවධානය යොමු විය.

මෙහිදී ඉන්දියානු රජයේ ණය අධාර ඇතිව ක්‍රියාත්මක නිවාස ඉදිකිරීමේ යෝජනා වැඩසටහන් මෙන්ම අමාත්‍යාංශ ප්‍රතිපාදන යටතේ ආරම්භ කර තිබෙන ප්‍රජා යටිතල පහසුකම් ව්‍යාපෘතීන්වල වත්මන් තත්ත්වය පිළිබඳව එම ආයතනයන් හි නිලධාරීන් විසින් ප්‍රගති වාර්තා ඉදිරිපත් කරන ලදී.

වැවිලි මානව සංවර්ධන භාරය විසින් ක්‍රියාත්මක නිවාස ව්‍යාපෘතිවලින් 2024 වසරේ තුන්වන කාර්තුවේ අග භාගය වන විට 2024 ට අදාලව නිවාස ඉදිකිරීම් සම්බන්ධ ව්‍යාපෘති වල ප්‍රගතිය 90% සීමාව ඉක්මවා ඇති බව අනාවරණය විය. හැටන්,නුවරඑළිය,නුවර සහ කෑගල්ල දිස්ත්‍රික්කවල පිළිවෙළින් සියයට 91%, 90% 92% 100% නිවාස යෝජනා ව්‍යාපෘතීන් ඉදිකිරීමේ ප්‍රතිශතය අවසන් අදියරවලට පැමිණ ඇත.

මීට අමතරව වැවිලි කලාප සඳහා වූ නව ගම්මාන අධිකාරිය විසින් (New Villages Development Authority For Plantation Region) ක්‍රියාත්මක නිවාස හිමිකම් සහ ඉඩම් ඔප්පු 1060 ප්‍රදානයට අදාළ කටයුතු සූදානම් කර තිබේ. ඉන් ඔප්පු 563ක් සම්පූර්ණ වශයෙන් ලියාපදිංචියද සිදුකර අවසන් තවත් ඔප්පු 497කට අදාලව ලියාපදිංචිය සිදුකරමින් පවතී.

මේ වන විට වැඩ අවසන් වී ඇති නිවාස සහ ලියාපදිංචිය අවසන් කර තිබෙන ඉඩම් හිමිකම් ඔප්පු දේශපාලන අධිකාරීය සම්බන්ධ කර නොගෙන රාජ්‍ය නිලධාරී මට්ටමින් ලැබිය යුතු සැබෑ ප්‍රතිලාභීන්ට කඩිනමින් ප්‍රදානයට අවශ්‍ය පියවර ගන්නා ලෙසට අමාත්‍යවරයා උපදෙස් ලබා දුන්නේය.

ඒ සම්බන්ධයෙන් අවධානය යොමුකර වැවිලි කර්මාන්තය සඳහා නව ගම්මාන අධිකාරිය මැදිහත්ව කඳුකර වතු ප්‍රජාවගේ  නිවාස සම්බන්ධ විධිමත් සංගණයක් සිදු කිරීමටද පියවර ගෙන ඇති බව මෙහිදී පෙන්වා දෙනු ලැබිණි. ඒ සඳහා ජංගම දුරකතන ඩිජිටල් තාක්ෂණය භාවිතා  කිරීමට නියමිතය.ඒ තුළින් කඳුකර වතු ප්‍රජාවගේ නිවාස මෙන්ම ඉඩම් සහ  යටිතල පහසුකම් සම්බන්ධයෙන් ප්‍රථම වරට විධිමත් දත්ත සංචිතයක් පවත්වාගෙන යාමට ද අපේක්ෂිතයි. එය ඉදිරි සංවර්ධන වැඩසටහන් වලදී කාර්යක්ෂම ලෙස භාවිතා කළ හැකි වනු ඇත.

මෙම සාකච්ඡාවේදී රාජ්‍ය ආයතන අතර පවතින සම්බන්ධීකරණ දෝෂ ඇත්නම් කඩිනමින් නිරාකරණයට අවශ්‍ය පියවර ගන්නා ලෙස නිලධාරීන්ට උපදෙස් ලබා දුන් අමාත්‍යවරයා මෙම ව්‍යාපෘති කඩිනමින් අවසන් කිරීමේ අවශ්‍යතාවය අවධාරණය කළේය.

අධ්‍යාපන මෙන්ම සෞඛ්‍ය සේවාවන්වල පවතින ගැටලු සම්බන්ධයෙන් පැමිණ සිටි නිලධාරීන් විසින් අමාත්‍යවරයාගේ  අවධානය යොමු කරන ලදී.  එහිදී කඳුකර ප්‍රජාවගේ නිවාසවල වෙසෙන පාසල් දරුවන් ඉලක්ක කර ගනිමින් ඔවුන්ගේ පෝෂණ තත්ත්වය ඉහළ නැංවීමේ අරමුණින් ක්‍රියාත්මක දිවා ආහාර ලබා දීමේ වැඩසටහන්වල පවතින අඩුපාඩු හඳුනාගෙන එය විධිමත් කිරීමේ අවශ්‍යතාවය පෙන්වා දෙනු ලැබිණි.

ඊට අමතර කඳුකර වතු නිවාස මුල්කරගෙන ක්‍රියාත්මක ආරෝග්‍ය ශාලාවන් හි පවතින ගැටලු නිරාකරණයට අදාල කරුණු වලදී රජයේ වතු සමාගම්වල සහය ලබා ගැනීමට නියමිත බවද නිලධාරීන් විසින් පෙන්වා දෙනු ලැබීය.

එලෙසම දමිළ ජනතාවගේ සුවිශේෂී උත්සව අවස්ථාවක් වන දීපවාලි වෙනුවෙන් කුඩා දරුවන් සහ ප්‍රජාව සම්බන්ධ වන විශේෂ සංස්කෘතික අවස්ථාවන් සංවිධානයට අවශ්‍ය පියවර ගන්නා ලෙස විෂය භාර අමාත්‍යවරයා උපදෙස් ලබා දුන්නේය.

සෞම්‍ය මූර්තිතොන්ඩමන් භාරය යටතේ හැටන් නගරයේ අලුතින් ඉදිකරන ලද සංස්කෘතික මධ්‍යස්ථානයේ  සංස්කෘතික හා වෘත්තිමය පාඨමාලාවන් සඳහා පාසල් හැර යන තරුණ ප්‍රජාව සහභාගී කර ගැනීමේ අවශ්‍යතාවයද පෙන්වා දෙනු ලැබූ අතර හෝටල් සේවා පාඨමාලා ඇතුළු වන වෘත්තීය පාඨමාලා කඳුකර තරුණ තරුණියන්ට හඳුන්වා දීමේ වැදගත්කමද අමාත්‍යවරයා අවධාරණය කළේය.

-මාධ්‍ය ඒකකය

සැ.යු (මෙම පුවතට අදාලව ඡායාරූප සහ වීඩියෝ දර්ශණද ලබා ගැනීමට ලින්ක් ලෙස යොමුකර ඇති අතර word Tex ලබා ගැනීම සඳහා ද පහසුකම් ඇත.)